# ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

## පාරිභෝගික උපදේශන කමිටු සාමාජික තනතුරු

## (සබරගමුව, මධ්‍යම සහ වයඹ පළාත්)

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මෙරට විදුලිබල කර්මාන්තයේ ආර්ථික, තාක්ෂණික හා ආරක්ෂණ නියාමන ආයතනය වන අතර, ජල සැපයුම් සේවා සහ ඛනිජ තෙල් යන කර්මාන්ත සඳහා නම් කළ නියාමන ආයතනය වේ. නියාමනය වන කර්මාන්තවල පාරිභෝගික අයිතිය ආරක්ෂා කිරීම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙහි ප්‍රමුඛ කාර්යභාරයකි. නිසි ප්‍රමිතීන් සකස් කිරීම, පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා වීම පිළිබඳ අධීක්ෂණය සහ පාරිභෝගිකයින් දැනුවත් කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට උපදෙස් ලබාදීම සඳහා පාරිභෝගික උපදේශන කමිටුවක් පිහිටුවා ඇත.

පාරිභෝගික උපදේශන කමිටුවේ සබරගමුව, මධ්‍යම සහ වයඹ පළාත නියෝජනය සඳහා පළාත සඳහා එම පළාතේ ස්ථිර සාමාජිකත්වය දරන පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ උනන්දුවක් දක්වන පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුයි**

- මෙම දැන්වීමේ දිනය වන විට වයස අවුරුදු 65ට අඩු විය යුතුයි.
- විශේෂයෙන්ම පාරිභෝගික ආරක්ෂණයට අදාලව ප්‍රජා/සමාජ සේවා කටයුතු පිළිබඳ උනන්දුව
- සිංහල හෝ දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමේ හැකියාව අමතර සුදුසුකමක් වනු ඇත.

**අයදුම්පත සමග ඉදිරිපත් කළයුතු අනෙකුත් ලියකියවිලි**

- ශ්‍රී ලංකාවේ පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ වචන 500 කට නොවැඩි රචනාවක්
- පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය
- ප්‍රදේශයේ සිවිල් සමාජ නායකයෙකු විසින් නිකුත් කරන ලද චරිත සහතිකයක්

අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහළ කොටසේ හෝ ඊමේල් පණිවිඩයේ විෂය නිරයෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අයදුම්පත් 2020 අගෝස්තු 21 වන දින හෝ එදිනට පෙර එවිය යුතු වේ.**

සභාපති,
**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව,**
6 වන මහල, ලංකා බැංකු වෙළඳ කුලුන,
28, ශාන්ත මයිකල් පාර, කොළඹ - 03.
දුරකථන : 011-2392607/8 ෆැක්ස්: 011-2392641
ඊමේල්: careers@pucsl.gov.lk
වෙබ් අඩවිය: www.pucsl.gov.lk
දිනය - 2020.08.07